## හදවතේ කව

| | |
|---|---|
| මූසිල නුඹ යි ඇඳුරිඳු මේ මම | හින්දා |
| පණිවිඩ එව්වෙ ලොකු මැණිකේ මා | කැන්දා |
| සටහන් කියන විට නුඹ මගෙ රුව | ඇඳිදා |
| මගෙ සිත සොරා ගත්තේ නුඹ ම යි | නන්දා |
| | |
| ආලය නොඉපදුණි නම් නුඹෙ ගැබෙහි | හද |
| අල්මාරියට පෙම් පත් විසි කළේ | කිම ද |
| අප්පච්චිට බියෙන් ඔහු අත් | බැන්දා ද |
| නුඹෙ සිත් කොනක මගෙ නම තිබුණා | නේද |
| | |
| සිහිවෙන හැම විට ම කඳුළැලි දෙනෙත | වසා |
| හදවත දෙදරවන පණිවිඩ ඇසුණ | නිසා |
| වාවනු නොහැකි සෙනෙහස ළය පිරුණු | නිසා |
| ආවෙමි නැවත හැම බාධක ගැටලු | නසා |
| | |
| තනිවුවත් එදා ගම හැරදා | කොළොම්තොට |
| සිත ඉකිබින්දෙ නිරතුරු නුඹ | දකින්නට |
| කැන්දන් යන්න යළි ආ දින | වලව්වට |
| බිත්තිත් හැඬුවා දැක පිරිහෙන | නම්බුවට |

සියඹලාගොඩගේ මිනුකා ෂෙහානි
සිව්වැනි වසර
සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය
shehanisiyambalagoda97@gmail.com

9 772950 655005